# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2087/8 - 2018 සැප්තැම්බර් මස 03 වැනි සඳුදා - 2018.09.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ගවරම්මාන, බෝගහකුඹුර ඒකාබද්ධ ජල සම්පාදන ක්‍රමයේ ජල පිරිපහදු ඒකකය හා නිල නිවාස ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2018 අගෝස්තු මස 21 වැනි දින,
අංක 35, ''ලක්දිය මැදුර''
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1411.

### උපලේඛනය

බදුල්ල දිස්ත්‍රික්කයේ, වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹේවෙල - ඒ ග්‍රාම නිලධාරි වසමේ වර්වික්වත්ත ග්ලෙන්ච් කොටස ක්ෂේත්‍ර අංක 06 ගමේ පිහිටි වර්වික්වත්ත ග්ලෙන්ච් කොටස ක්ෂේත්‍ර අංක 06 නැමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් අක්කර 02 රූඩ් 02 ක පමණ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස හා රෙන්දපොල අඹේවෙල පාර ; |
| *නැගෙනහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස හා රෙන්දපොල අඹේවෙල පාර ; |
| *දකුණට* | : | අඹේවෙල වාරිමාර්ග ඇල ; |
| *බටහිරට* | : | එම ඉඩමේ ඉතිරි කොටස හා රෙන්දපොල අඹේවෙල පාර. |

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය* :- ප්‍රධාන විධායක නිලධාරි,
වර්වික් - හග්ගල වත්ත,
මල්වත්ත වැලි වැවිලි සමාගම
අඹේවෙල.

09 - 425


1A - G 28394 — 18 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*